# රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

# නව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා ග්‍රාම නිලධාරී වසම් පිහිටුවීම සහ ප්‍රතිශෝධනය කිරීම සඳහා යෝජනා කැඳවීම

පරිපාලනමය හා සංවර්ධනමය ප්‍රමුඛතා පදනම් කර ගනිමින් නව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා ග්‍රාම නිලධාරී වසම් පිහිටුවීම සහ ප්‍රතිශෝධනය කිරීම පිළිබඳව ලැබෙන විවිධ ඉල්ලීම් සලකා බලා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස රජය විසින් සීමා නිර්ණය කමිටුවක් පත්කර ඇත.

1. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ජ්‍යෙෂ්ඨ උපදේශක සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ හිටපු අධිපති එච්.බී.දිසානායක මහතා සභාපතිත්වය දරණ මෙම කමිටුවට දැනට රාජ්‍ය සේවයේ සිටින හා විශ්‍රාමික ප්‍රවීන නිලධාරීන් දහතුන්දෙනෙක් ඇතුළත් වේ.

2. මෙම කමිටුවේ නිර්ණය විෂය පථය පහත පරිදි වේ.
   - 2.1 නව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පිහිටුවීම හා පවත්නා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සීමා ප්‍රතිශෝධනය කිරීමට අදාළ යෝජනා/ ඉල්ලීම් අධ්‍යයනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම.
   - 2.2 නව ග්‍රාම නිලධාරී වසම් පිහිටුවීම හා ග්‍රාම නිලධාරී වසම් සීමා ප්‍රතිශෝධනය කිරීමට අදාළ යෝජනා/ ඉල්ලීම් අධ්‍යයනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම.

3. ඉහත සඳහන් 2.1 හා 2.2 කරුණු පිළිබඳව ලිඛිත නියෝජන පහත ආකෘතිය පරිදි සවිස්තරාත්මකව ඉදිරිපත් කරන ලෙස කමිටුව විසින් මහජන නියෝජිතයන්, සිවිල් සංවිධාන, රාජ්‍ය නිලධාරීන් හා මහජනතාවට ආරාධනා කරන අතර, එම නියෝජනයන් 2010.05.30 දිනට හෝ ඊට පෙර කමිටු ලේකම් වෙත ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ විද්‍යුත් තැපෑලෙන් හෝ පැමිණ භාර දෙන ලෙස කාරුණිකව දැනුම් දෙමි. (මෙම තොරතුරු www.pubad.gov.lk වෙබ් අඩවිය මඟින්ද ලබා ගත හැකිය)

**එස්.කේ.වීරතුංග**
**ලේකම්**
**සීමා නිර්ණය කමිටුව**

**2010 අප්‍රේල් මස 26 දින**

දිනය : .....................................

- මහජන නියෝජිතයාගේ/සිවිල් සංවිධානයේ/ රාජ්‍ය නිලධාරියාගේ/ලියුම්කරුගේ } නම : .....................................................................
- ලිපිනය : ............................................................................ දුරකතන අංකය : ..........................................
- මෙම යෝජනාව අළුතින් පිහිටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් සඳහාද නැතහොත් දැනටමත් පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක ප්‍රතිශෝධනයක්ද යන වග : ..........................................................
- මෙම යෝජනාව අළුතින් පිහිටුවන ග්‍රාම නිලධාරී කොට්ඨාශයක් සඳහාද නැතහොත් දැනටමත් පවතින ග්‍රාම නිලධාරී කොට්ඨාශයක ප්‍රතිශෝධනයක්ද යන වග : ..........................................................
- යෝජනාව සහ යෝජනාවට මූලික වූ හේතු : ..........................................................
  (කරුණාකර ඔබගේ යෝජනා, එම යෝජනාවට මූලික වූ හේතුන්ද සමඟ වෙනත් කඩදාසියක සටහන් කර මෙයට අමුණන්න. එක් එක් යෝජනාව සඳහා වෙන වෙනම වාර්තා ඉදිරිපත් කරන්න)

**ලිපිනය: එස්.කේ.වීරතුංග**
**(අතිරේක ලේකම් - ස්වදේශ කටයුතු)**
**සීමා නිර්ණය කමිටුවේ ලේකම්**
**රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටුයුතු අමාත්‍යාංශය**
**නිදහස් චතුරශ්‍රය, කොළඹ 07**

**දුරකථන අංක :- 2687772,2687774, 2696211**
විද්‍යුත් තැපැල:- adsecha@pubad.gov.lk
ෆැක්ස්:- 2688206, 2691073